Matale Zonal Education Office – Matale Zonal Education Office – Matale Zonal Education Office – Matale Zonal Education Office – Matale Zonal Education Office – Matale Zonal Education

e-Learning Programme - 2020

Grade - 08 | **බුද්ධ ධර්මය** | **Assignment - 01**

- **පෙළපොත භාවිතා කොට අසා ඇති සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**
- **විෂය භාර ගුරුභවතාට යොමුකොට පිළිතුරු තහවුරු කර ගන්න.**

I කොටස

1. සැරියුත් මහරහතන් වහන්සේ දැරූ අග තනතුර කුමක්ද?
2. බුදු රජාණන් වහන්සේ සුදුරෙදි කෑල්ලක් අතට දී "රජෝහරණං" යනුවෙන් කියමින් රෙදිකඩ පිරිමදින්න යැයි ප්‍රකාශ කළේ කුමන තෙරුන්ටද?
3. බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය නම් කරන්න.
4. උපතිස්ස - කෝලිත යන දෙදෙනාගේ මුල් ගුරුවරයා නම් කරන්න.
5. බුද්ධ ශාසනයේ පැවැත්මට යැයි පවසමින් බුදු රජාණන් වහන්සෙගේ පංචවරය ඉල්ලා සිටි භික්ෂූන් වහන්සේ කවුද?
6. "මහනෙල් මල් සුවඳමය - කුඩමසු පිළි ගඳමය - දෙකට එකම දියමය - හොඳට නරකට දෙකට කටමය" මෙම පද්‍යයෙන් පිළිබිඹු වන ආචාරශීලි ගුණාංගය කුමක්ද?
7. ධර්ම රත්නයේ ගුණ කීයද?
8. ආහාර ගැනීමේදී , වස්ත්‍ර සකස් කරගැනීමේදී බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇති ආචාර ධර්ම සමුදාය හඳුන්වන නම කුමක්ද?
9. "යේ ධම්මා හේතුප්පභවා" යන ගාථාවෙන් ඉගැන්වෙන බුදු දහමේ මූලික ඉගැන්වීම් කුමක්ද?
10. ගිහි-පැවිදි යුතුකම් ලෙස බුදුරජාණන් වහන්සේ මනා ලෙස විග්‍රහ කර ඇති සූත්‍ර දේශනාව නම් කරන්න.
11. අෂ්ටගරු ධර්ම බුදු රජාණන් වහන්සේ පැනවූයේ කවුරුන් හටද?
12. තමාගේ වෙනත් කටයුතු පසෙකින් තබා සිතට නගා ගැනීමට සුදුසු බැවින් ධර්මය කුමන ගුණයකින් හැඳින්වේද?
13. සැරියුත් තෙරණුවෝ රහත් වූයෙක කුමන සූත්‍රය අසාද?
14. සෝණදන්ඩ බමුණා වාසය කළේ කොහේද?
15. නන්ද කුමරුගේ බිසව කවුද?
16. අනේ පිඬු සිටුතුමා කරවූ වෙහෙර කුමක්ද?

17. ධම්ම පදය අයත් වන නිකාය කුමක්ද?

18. "අත්පොත් නැබීම" යනුවෙන් හඳුන්වන පැරණි සිරිත කුමක්ද?

19. "ගුරු බස සැබෑමය" යන පදයය ඇතුළත් ග්‍රන්ථය නම් කරන්න.

20. "අතු කීපයක් සහිත පුවක් පැළයක් තබා" රාජ්‍ය සකසනු ලබන අවස්ථාව කුමක්ද?

II කොටස

1.
   i. "ඉඳ ඉඳ එක වෙහෙර - විඳ විඳ දහම් මනහර" යන කවිය සම්පූර්ණ කරන්න.
   ii. දෙව්දත් තෙරුන් විසන් ඉල්ලා සිටි පංචවරයෙන් කරුණු 3 ක් ලියන්න.
   iii. ශිෂ්‍යයෙකු ලෙස ඔබට පන්ති කාමරයේදී මුහුණ පෑමට සිදුවූ ගැටළුවක් ලියා එය විසඳාගන්නා ආකාරය පැහැදිලි කරන්න.

2.
   i. බුද්ධචරිතයෙන් පිළිබිඹුවන ආචාරශීලී ගුණාංග 2 ක් ලියන්න.
   ii. ඉන් එක් ගුණාංගයක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.
   iii. මෙම ආචාරශීලි ගති පැවතුම් අනුගමනය කිරීමෙන් පාසල් දරුවන් වන ඔබලාගේ ජීවිත සාර්ථක කරගන්නා අයුරු කෙටියෙන් ලියන්න.

3.
   i. සිරිත් හා විරිත් යනු මොනවාදැයි කෙටියෙන් ලියන්න.
   ii. බෞද්ධ දරුවකු වන ඔබට උපන්දින සැමරුමකදී කළ හැකි යහපත් දේවල් 3 ක් ලියන්න.
   iii. අපට එදිනෙදා කටයතු වලදී බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කිරීමෙන් ලැබෙන යහපත පැහැදිලි කරන්න.

4.
   i. බුද්ධානුස්සති භාවනාව යනු කුමක්ද?
   ii. නව අරහාදී බුදුගුණ වලින් 3 ක් නම් කරන්න.
   iii. බුද්ධානුස්සතී භාවනාවෙන් අපට ලැබෙන ප්‍රයෝජන 5ක් ලියන්න.

5.
   i. සැරියුත් - මුගලන් මහරහතන් වහන්සේලාගේ ගිහිකළ නම් ලියන්න.
   ii. මුගලන් මහරහතන් වහන්සේගේ පරමාදර්ශී කාර්යයන් 3 ක් ලියන්න.
   iii. "යේ ධම්මා හේතුප්පභවා" යන ගාථාව සම්පූර්ණ කර එහි තේරුම ලියන්න.

6.
   i. ත්‍රිවිධ රත්නය නම් කරන්න.
   ii. ධර්ම රත්නයේ ගුණ කීයද? ඒවා පිළිවෙලින් ලියා දක්වන්න.
   iii. ධර්ම රත්නයේ සවැදෑරුම් ගුණ වලින් එකක් පිළිබඳ කෙටියේ පැහැදිලි කරන්න

7.
   i. "යෝච පුබ්බේ පමජ්ජිත්වා" ..... යන ගාථාව සම්පූර්ණ කරන්න.
   ii. එම ගාථාවේ අදහස ලියන්න.
   iii. බුදුරජාණන් වහන්සේ මෙම ගාථාව දේශනා කිරීමට හේතුවූ කතා පුවත ලියන්න.

www.ikedu.lk